# සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය

විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

වාරය : දෙවන වාරය

ඒකකය - ඇවිදින කොළයා

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.
නිපුණතා මට්ටම : 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

ඉගෙනුම් පල

- පොත පත කියවා තොරතුරු රැස් කරයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවා පාරිභාෂික වචන පැහැදිලි කරයි.
- කියවීමෙන් ග්‍රහණය කරගත් තොරතුරු ඉදිරිපත් කරයි.
- විවිධ පොතපත කියවීමේ පුරුදු අගය කරයි.

**1. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**I පාඩමේ සඳහන් ඇවිදින කොළයා උපත ලබන්නේ,**

(අ) කොළවලින්
(ආ) ජලයෙන්
(ඇ) බිත්තවලින්

**II කොළයා කොළයක හැඩරුව ගන්නේ,**

(අ) මිනිසුන්ගෙන් බේරීමට
(ආ) කුරුල්ලන්ගෙන් බේරීමට
(ඇ) වර්ෂාවෙන් බේරීමට

**III සතුරන්ගෙන් බේරීමට මොහුට ප්‍රයෝජනවත් වන්නේ,**

(අ) දිග අඬු සහ විෂ දළයි
(ආ) හොඳින් ශබ්ද ඇසීම හා පෙනීමයි
(ඇ) හැඩහුරුකම හා පාටයි

**IV කොළයා දමන බිත්තරවල හැඩය**

(අ) කරවිල ඇට වැනි
(ආ) කුරක්කන් වැනි
(ඇ) මදටි ඇට වැනි ය

**V කොළයා ආහාරයට ගන්නේ,**

(අ) කෘමි සතුන්
(ආ) කොළ වර්ග
(ඇ) පලතුරු වර්ග

**2. පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි (✓) ලකුණ ද වැරදි (✗) නම් වැරදි ලකුණු ද යොදන්න.**

I බොහෝ සත්තු අනතුරුවලින් බේරීමට උපායන් යොදති. ( )

II කොළයා අපගේ පයට පෑගුණ ද මිය යන්නේ නැත. ( )

III කොළයට ඒ නම ලැබී ඇත්තේ කොළයකට සමාන නිසා ය. ( )

IV කොළයා දරුණු විෂ සහිත සතෙකි. ( )

V **කොළයා කොළයක හැඩරුව ගන්නේ මිනිස්සුන්ගෙන් බේරීමට ය.** ( )

**3. අර්ථය ගැළපෙන සේ යා කරන්න.**

| අ | ආ |
|---|---|
| උපාය | සෑම ආකාරයෙන් ම |
| අන්තරාය | ස්වරූපය |
| හැඩහුරුකම | සැලසුම |
| සෙවිල්ල | සෝදිසියෙන් |
| හැම විදියෙන් ම | අනතුර |

**4. අදාළ විරාම ලකුණේ සංකේතය යොදන්න.**

| | |
|---|---|
| I තිත | |
| II ප්‍රශ්නාර්ථය | |
| III කොමාව | |
| IV විස්මයාදී ලකුණ | |
| V පෙරලි කොමා | |

**5. පහත සඳහන් ඡේදය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.**

දරුවෙනි මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහීත වූ පුෂ්කරණීහුත් වෙති එසේ හෙයින් තොපි හැම නො කෑ විරූ ඵලාඵලයෙක් කතොත් වේවයි නුපුු විරූ පැනක් බොතොත් වේවයි මා විචාරා ම කව බොව යි විධාන කළෝ ය ඒ වානරයෝත් එබස් යහපතැ යි පිළිගෙන එක් දවසක් පෙර නො ගිය විරූ තැනකට ගොස් එතැන්හි දහවල් දෙවරු ඇවිද පැන් සොයන්නාහු එක් පොකුණක් දැක පැන් නො බී ම බෝධිසත්වයන්ගේ ඊම බලා උන්නාහු ය එකල්හි බෝධිසත්වයෝත් අවුල් කිමෙක් ද දරුවනි පැන් නො බොව් දැ යි කිවූ ය

**ඇවිදින කොළයා**

**පිළිතුරු පත්‍රය**

**1.**

I. (ඇ)
II. (ආ)
III. (ඇ)
IV. (අ)
V. (ආ)

**2.**

I. ✓
II. ✗
III. ✓
IV. ✗
V. ✗

**3.**



**4.**

| | |
|---|---|
| I | . |
| II | ? |
| III | , |
| IV | ! |
| V | “ ” |

**5.**

“දරුවෙනි, මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහීත වූ පුෂ්කරණීහුත් වෙති. එසේ හෙයින් තොපි හැම නො කෑ විරූ ඵලාඵලයෙක් කතොත් වේවයි නුපූ විරූ පැනක් බොතොත් වේවයි මා විචාරා ම කව බොව” යි විධාන කළෝ ය. ඒ වානරයෝත් එබස් “යහපතැ” යි පිළිගෙන එක් දවසක් පෙර නො ගිය විරූ තැනකට ගොස් එතැන්හි දහවල් දෙවරු ඇවිද පැන් සොයන්නාහු, එක් පොකුණක් දැක පැන් නො බී ම බෝධිසත්වයන්ගේ ඊම බලා උන්නාහු ය. එකල්හි බෝධිසත්වයෝත් අවුල් “කිමෙක් ද? දරුවනි, පැන් නො බොව් දැ” යි කිවූ ය.